
# කවි කොළය

## ඩෙංගු



දිනකට එකා ගාණේ ඩෙංගුවට මැරේ
හෙට මෙය මහා ව්‍යසනයක් බවට හැරේ
උතුරේ මෙන්ම රට මැද සහ දකුණු කරේ
මර බිය නිසා තැතිගැන්මකි ගෙදර දොරේ

අවුරුද්දකට වැඩි දිගු කාලයක සිට
බැක්ටීරියාවක් කියුබා රටෙහි සිට
ගෙන්වා ඉසින්නෙමි අහසින් කියපු කට
වැහුණා බදුල්ලෙන් මිනිසුන් මැරෙන විට

උණ රෝගයෙන් හතළිස් දහසකට වඩා
රෝහල් ගතව ඇත මේ දිවයිනෙහි කුඩා
බෙහෙතක් තවම නැත රැකගනු පිණිස ලෙඩා
වැළපෙති, තැවෙති, කම්පාවෙති රටම හඬා

මේ ව්‍යසනය අවුරුදු හය හතක සිට
ටික ටික වැඩී ආ අන්දම දනිති රට
සුව සේවාව අද ඇරගෙන සිටින කට
නැත දැක්කුවේ සැලකිල්ලක් තඹය කට

බැක්ටීරියා එක සිරිපාලගෙ ඩෙංගු
පාරක තවම කැරකෙයි දහඅට වංගු
සිරිසෙන් ඇමති වුව ඒ පුටුවට රිංගු
කාසිය බවට පත්විය හැක අව ලංගු

උණ රෝගින්ගෙ දුක සැප දෙක සිටිය බලා
හෙදියන් සමග සිටි දොස්තරවරුද මළා
(කොටියා මරා යුද උවදුර ඉවර කළා)
පොඩි මදුරුවා වද දෙයි අද රටම පෙළා

පිරිසිදු දියේ මිස නැත ඌ ගොහොරු මඩේ
පාරේ කානු උතුරයි කැලි කසල ගොඩේ
මිය යන්නේද මිනිසුන්මය හැදුණු ලෙඩේ
රජයෙන් ගසයි වත්තේ කුණුගොඩට දඬේ

ජනතාවගෙන් වැඩි කොටසක්
තවම හරක්
ගොං බණ්ඩලා රට රටවල
ගහති කරක්
ඩෙංගුව හැදී මිය යනතුරු
ඇමති පොරක්
මේ ව්‍යසනය පවතී වී
රටට බරක්



♦ තලන්ගම ජයසිංහ
Sri Lanka

# වාදකයා ගැරඬියා මෙල්ල කළ හැටි!

මෙම කතාවට සම්බන්ධ වයලීන් වාදකයාගේ අනන්‍යතාව ආරක්ෂා කරනු පිණිස ඔහුට මම සිරිල් යයි අමතමි.

සිරිල් දක්ෂ වයලීන් වාදන ශිල්පියෙකි. ගීත පටිගත කිරීම කට හෝ සංගීත සංදර්ශණයකට හෝ ශ්‍රී ලංකාවේ මොනයම් සංගීත කටයුත්තක දී හෝ ඔහු ගේ සේවාව නැතිවම බැරුවා සේ ම ඔහු ද සිය කාර්‍ය්‍යය මැනවින් ඉටුකර දෙන්නේය. තමා බාරගත් කිසිම වැඩක් ඔහු අතපසු කරන්නේ නැත.

මේ මෑතක දිනක් පොරොන්දු වූ සංගීත පටිගත කිරීමකට සිරිල් ගේ නොපැමිණීම කාගේත් කුතුහලයට හේතු විය. දින ගණනකට පසු ඔහු නැවත පැමිණි විට සංගීත සගයෝ නොපැමිණීමට හේතු විමසන්නට වට වූහ.

සිරිල් වාසය කළේ කොළඹින් මඳක් ඈත පරණ තාලයට තනන ලද පරණ ගෙදරක ය. නවීන පන්නයේ ගෙවල්වල මෙන් ගේ අභ්‍යන්තරයේ හෝ, ගෙට යාබදව හෝ වැසිකිළියක් එහි නොවීය. තිබුණේ ගෙට යාර 15 ක් හෝ 20 ක් පමණ ඈතින් පරණ තාලයේ වළ කක්කුස්සියකි.

දිනක් සැන්දෑ යාමයේ සිරිල් වැසිකිලියට ගොස් සිය කාර්යය ඉටු කරන අතරේ වැසිකිළි වළට රිංගා සිටි ගැරඬියෙක් ඔහුගේ පස්සා පැත්ත හෙවත් තට්ටම දෂ්ට කළේ ය. තුවාලයෙන් තද බල ලෙස ලේ ගැලුවත් ඔහු කළබල වුනේ නැත. මක්නිසාද, ගැරඬියා විෂ නැති සර්පයෙකු නිසාය. තුවාල වේලී සුව වන තුරු ඔහුට සංගීත කටයුතු වලට යන්නට බැරි විය.



ඔහුට සිදුවූ මේ මහා එමෙන්ම හිතන්නවත් බැරි අකරතැබ්බය ඇසූ යහළුවෝ විවිධ දේ යෝජනා කළෝ ය. ඇතැම්මු අළුත් පන්නයේ වැසිකිළියක් සාදා ගන්නා ලෙස ද කීහ.

" ඕව කරන්න මට සල්ලි නැහැ.........." සිරිල් කෙලින්ම කීවේය.

" සල්ලි නැත්නම් බැංකුවෙන් ණයක් හරි අරගෙන හදනවා නේ."

" බැංකුවෙන් ණය ගත්තත් මම ගෙවන්න එපායැ.......... ඒකට සල්ලි කෝ.........? " සිරිල් තව දුරටත් කීවේ ය. " ඊටත් ගැරඬියා විෂ ඇති සර්පයෙක් නෙවෙයි නේ.........."

යහළුවන් කාටත් කාරණය වැටහුණි. ඉන් එහාට කිසිවෙකු කිසිවක් කීවේ නැත.

ටික කලකට පසු සිරිල් නැවත දින දෙක තුනක් රෙකෝඩිංවලට ආවේ නැත. ගැරඬියා ආයිත් සිරිල්ගේ පස්සා පැත්තට ඇටැක් එකක් දීලා වගේ කවුරුත් සිතූහ. සිරිල් නැවත පැමිණි විට කාටත් දැන ගන්නට උවමනා වුනේ ගැරඬි යුද්ධය ගැන ය.

" ආයිත් ගැරඬියා කෑවද මචං....? " යාළුවෝ එක හඬින් ඇසූහ.

" අපෝ නැහැ...ගැරඬියාගෙන් දැන් මට කිසිම ප්‍රශ්නයක් නැහැ...". සිරිල් කීවේ ය.

" ඇයි ගැරඬියා මරල දැම්මද....? එහෙම නැත්තම් බෙහෙත් ගහල පන්නලා දැම්මද....? " ඔව්හු ඇසූහ.

ඒ සෑම ප්‍රශ්නයකටම සිරිල්ගේ පිළිතුර වූයේ නැහැ යන්නයි. කාටත් දැන් අවශ්‍ය ගැරඬියා දමනය කළේ කොහොමද කියා දැන ගැන්මට ය. එක හඬින් ඔව්හු ඒ රහස ගැන අසා සිටියහ.

" මා ළඟ ඔය යන්ත්‍ර මන්ත්‍ර, දැපන මුකුත් නැහැ.... මං මචං එහෙනම් උඹලට ඇත්තම කියන්නම්.... දැන් අපේ ගෙදර කවුරුත් කක්කුස්සියට යන්න ඉස්සෙල්ලා පුකේ බූමිතෙල් ගා ගන්නවා....."

සිරිල් රහස හෙළි කළේ ය. (මෙය සත්‍ය කතාවකි)

♦ ආනන්ද කාරියවසම් Slough Berks UK




**ඉරිදා - SUN** රන්ජනී පෙරේදා අපේ දිහා ආව කලබලේ. ආපු ගමන් මගෙන් ඇහුවෙ එයාගෙ මූකුත් අමුත්තක් එහෙම පේනවද කියලා. මම නෑ කිව්වා. ආයිත් හොඳට බලන්න කියලා කිව්වා. මං ඇහුවා, කෝ ඔයාගෙ ඇහි බැම කියලා. ඒපාර හිනාවුණා. හැමර්ස්මිත් පැලේ එකට ගියාලු ඇමරිකාවෙ ඉඳලා ආපු කොස්මෙටික් විශේෂඥ යෙක් හම්බු වෙන්න. ඒ මැන් පවුම් 700 කට රන්ජනීගෙ ඇහි බැම ගලවලා කණ හරියෙ හයිකරලා. රන්ජනී කියනවා ඒකලු දැන් අළුත් ස්ටයිල් එක. මං කිව්වා රන්ජනී මිනිහට කියලා නහයත් ගලවලා ඔළුව පිටි පස්සෙ හයිකරගන්න. එතකොට හෙම්බිරිසාව හැදුනම කාටවත් පේනනෙ නැතිවෙන්න ඔයාට හොටු හූරගන්න පුළුවන් කියලා. එයා වචනයක්වත් නොකිය යන්න ගියා. තරහවෙලා වෙන්න ඇති. විකාර !

**සඳුදා - MON** අපේ ලොකුමාම මැරුණා කියලා අපි දැනගත්තෙ ගිය සතියෙ ලන්ඩන් ආපු මිසිස් සමරසේකරගේ බැණගෙන්. එයා මරණෙට ගියා කිව්වා. මං කිව්වා ඒ කියන කං අපි දන්නෙ නෑ කියලා. මම අද ටෙලිපෝන් කරලා සුනිල් අයියගෙන් ඇහුවා ඇයි තාත්තගෙ මරණෙ අපිට දැන්නුවෙ නැත්තෙ කියලා. එයා කියනවා දැන්නු වත් වැඩක් නැහැනේ නංගියෙ උඹලට ඔහේ ඉඳලා එන්නත් බැහැනේ. ඒක හන්දයි කිව්වෙ නැත්තෙ කියලා. ඒ තමයි ලංකාවෙ පිළිවෙල.

**කුජදා - TUE** පෙරේදා මම තලවකැලේ නැන්දම්මට කතා කෙරුවා. අනේ නැන්දම්මා අසනීප වෙලා ඉඳලා තියනවා. එලොව ගිහිං මෙලොව ආවයි කිව්ව. මං කිව්වා එහෙම කියන්න එපා කියලා. නෑ දුවේ දැන් ඉතින් අපි වැඩිය බර ඒපැත්තට නේ කිව්වා. නැන්දම්ම ජීවමාන දානයක් දෙන්න ලෑස්ති වෙනවා. ඒ කියන්නෙ ජීවතුන් අතර ඉන්දැද්දීම තමන් වෙනුවෙන්ම තමන් සාංඝික දානයක් දෙනවා. තමන්ම තමන්ට පාංසුකූලෙත් දෙනවා. මම කිව්වා එහෙම දානයක් ගැන මම අහලා තියන විත්තිය. ඒපාර නැන්දම්මා මෙහෙම කිව්වා. දුවේ ඒකට තව හේතුවකුත් තියනවා. කවුද දන්නෙ මං මැරු-ණම මුන් මං වෙනුවෙන් දානයක්වත් දේවිද කියලා. නැන්දම්මා මුන් කියලා කිව්වෙ සුවර්ණටයි කාන්තිටයි.

**බුදදා - WED** සරෝජිනියි නලීනුයි දෙන්නා ඊයෙ ලංකාවට ගියා. එහේ වෙඩිං පහක් තියනවයි කිව්වා. ඇඳුම් පැළඳුම්, සපත්තු, සෙරෙප්පු, හෑන්ඩ් බෑග් ගොඩක් සූට් කේස්වල දැම්මා. මං ඇහුවා මෙච්චර ගොඩක් මගුල් ගෙදර එන ඔක්කෝටම එක්කද කියලා. නලීන් කිව්වා, මං ගෙනියන්නෙ මේ සූට්එක විතරයි කියලා. සරෝජිනී කියනවා මං කොහොමද මගුල් ගෙවල් පහකට එකම අඳින්නේ? පිරිමි වගේ නෙවෙයි, ගෑණු හොඳට නෝට් කරගෙන ඉඳලා කියාවි, අපෝ අරයා එදා ඇඳපු සාරි යම අන්න අදත් ඇඳන්, ඒ සෙරෙප්පුම අදත් දාන් ඇවිල්ලා කියලා. සරෝජිනීගෙ කතාව හරි. ලංකාවෙ විතරක් නෙවෙයි මුළු ලෝකෙම ගෑණු ඒ විදිය තමයි.

**ගුරුදා - THU** තිලකසිරිලගෙ ලංකාවෙ මිනීපෙට්ටි සාප්පුවෙ මැනේජර් ලන්ඩන් ඇවිත් ඉන්නවා එම්බාම් කෝස් එකක් කරන්න. පෙරේදා අපේ එක්කෙනාට ටූටිං වලදි හම්බවෙලා හුඟාක් දේවල් කතාකෙරුවලු. එයා කිව්වලු, මෙහේ පාලර් එකේ එක මැරිච්ච සුද්දෙක් එම්බාම් කරන්න යන වියදමෙන්, ලංකාවෙ මිනී විසිපහක් එම්-බාම් කරන්න ඇහැකිය, මොකද, දැන් එහේ බොන අරක්කුවල හැටියට මැරුණම එම්බාම් බෙහෙත් ඕන නැත, අර ඊජිප්තුවෙ පිරමීඩ්වල වගේ ලංකාවෙ මිනී අවුරුදු දහස්ගණනක් වුනත් තියාගන්න ඇහැකිය, කියලා. බලන්න ඉතිං අපේ අය කොච්චර අනාගතේ ගැන හිතලා කටයුතු කරනවද? නේද?

**කිවිදා - FRI** ඇමති මර්වින් සිල්වා සැරයක් කියලා තිබුණා එයාගෙ ආසනේ - කැළණියෙ, කවුරු හරි කෙනෙක් ඩෙංගු වලින් මැරුණොත් ඒ පළාතෙ ඉන්න සෞඛ්‍ය පරීක්ෂකවරු ටික සේරම ගෙනැල්ලා ගස් බඳිනවා කියලා. ඒක මර්වින්ගේ නිකම් කටට ආපු වාචාල කතා වක් හැටියටයි කවුරුත් වගේ ගත්තෙ. නමුත් අන්න ඒ කිව්ව වගේ මෑන් පෙරේදා කාවද උසස් නිලධාරියෙක් ඩෙංගු රැස්වීමකට ආවෙ නෑ කියලා ඒ නිලධාරියාව අල්ලලා පොල් ගහක බැඳලා. මට පේන්නෙ නම් ඒ ක්‍රියාව අර වඳුරා කඩුව අතට ගත්ත වගේ වැඩක්.

**ශනිදා - SAT** ගිය සතියෙ රන්ජිත්ගෙ දුවගෙ උපන්දින උත්සවේ ට අපි ගියා. සුධර්මා ආන්ටිත් ඇවිල්ලා හිටියා. එයා දැන් ඇඟ බස්සගන්න වෙම්බ්ලිවල තැනක ඒරෝ බික් ක්ලාස් එකකට යනවයි කිව්වා...ඇන්ටිගෙ කතාවෙන් මට තේරුණා, එයා හරි ආසයි කෙට්ටුය කියලා කාගෙන් හරි අහගන්න. මගෙන් ඇහුව, එයා දැන් ස්ලිම් නේද කියලා. මං කිව්වා... " අපොයි ඔව් ආන්ටි ඔයා කොච්චර කෙට්ටුද කියනව නම්... දැන් මේ ළඟ හිටියත් ඔයාව මට පේන්නෙ නෑ... කතා කරන වචන විතරයි ඇහෙන්නෙ...." කියලා. ඇන්ටි දැන් මා එක්ක කතාකරන්නෙ නෑ... තරහවෙලාද කොහේද...

## Churchill's gold dentures sold for £15,000
## චර්චිල්ගේ රත්‍රං දත්කූට්ටම වෙන්දේසි කෙරේ

**Sir Winston Churchill's** gold-mounted dentures were snapped up at auction in Norfolk, England for **£15,200** by an anonymous fan who already owns the microphone Churchill used to announce the end of **World War II**

මහා බ්‍රිතාන්‍යයේ හිටපු සුප්‍රකට අගමැති සර් වින්ස්ටන් චර්චිල් පාවිච්චි කළ රත්‍රං ආලේප කරන ලද බොරු දත්කූට්ටමක් එංගලන්තයේ නොර්ෆෝක් හි දී ගිය සතියේ පවුම් 15,000 කට වෙන්දේසියේ විකිනිණ. නම හෙළි නොකළ එය මිළදීගත් තැනැත්තා ළඟ චර්චිල් දෙවන ලෝක යුද්ධය ඉවර වූ බව ප්‍රකාශ කළ මයික්‍රොපෝනය ද තිබෙන බව කියති.



